දුරකථන
தொலைபேசி
Telephones } 011-2136600
011-2136650

ලේකම්
செயலாளர்
Secretary } 011-2136602

ෆැක්ස්
தொலைநகல்
Fax } 011-2876169
011-2876181

විද්‍යුත් තැපැල
மின் - அஞ்சல்
E-mail } info@psc.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
Website } www.psc.gov.lk

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
No. 1200/9, Rajamalwatta Road, Battaramulla

මගේ අංකය
எனது இல.
My No. } PSC/EST/05-03/03/2019

ඔබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2020.07. 31

රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ : 01/2020 (I)

අමාත්‍යාංශ ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>අනුමත බඳවා ගැනීමේ පටිපාටි සහ සේවා ව්‍යවස්ථා වල සඳහන් "පූර්වාසන්න වසර පහක (05) සතුටුදායක සේවා කාලය " සම්බන්ධව වන විධිවිධානයන් සංශෝධනය කිරීම</u>**

රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 අනුව එක් එක් අවස්ථාවන්වලදී පහත උදාහරණ වල සඳහන් පරිදි කටයුතු කල යුතු අතර එම චක්‍රලේඛනයේ සඳහන් හා මෙහි සඳහන් නියමයන් අනුව කටයුතු කිරීමේදී යම් අපැහැදිලිතාවයක් ඇතිවන්නේනම් ඒ සම්බන්ධව පැහැදිලි කර ගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් ලබා ගැනීමට කටයුතු කල යුතුය.

1. උදාහරණ 01

අනුමත බඳවා ගැනීමේ පටිපාටිය හෝ සේවා ව්‍යවස්ථාවේ හෝ සඳහන් විධිවිධාන අනුව නිර්බාධක ක්‍රමය යටතේ වසර 10ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසු ඉහළ ශ්‍රේණියට උසස්වීමට හැකි අවස්ථාවකදී, පළමු උපලේඛනය අනුව විනයානුකූල දඬුවමක් ලැබූ නිලධාරියකුගේ ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස්වීමේ දිනයත් උසස්වීමට අදාළ අනෙකුත් සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇත්නම් වරද සිදු කරනු ලැබූ දිනය අනුව පහත සඳහන් පරිදි වේ.

| | | | |
|---|---|---|---|
| පත්වීම් දිනය | 2010.01.02 | 2010.01.02 | 2010.01.02 |
| වරද සිදු කල දිනය | 2014.05.20 | 2017.05.20 | 2019.05.20 |
| වසර 10ක සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කරනු ලබන දිනය | 2020.01.02 | 2020.01.02 | 2020.01.02 |
| වසර 10ක සතුටුදායක සේවා කාලය සම්පූර්ණ කරනු ලබන දිනය (කාර්යපටිපාටික රීති 186 (ii) අනුව වසර තුනක කාල සීමාවක් සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේදී බැහැර කිරීම අනුව) | 2023.01.02 | 2023.01.02 | 2023.01.02 |
| රා.සේ.කො. චක්‍රලේඛ අංක 01/2020 සඳහන් විධිවිධාන අනුව උසස්වීමට සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන දිනය (අනෙකුත් සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇත්නම්) | **2023.01.02** | **2023.01.02** | **2023.01.02** |

සටහන

ලබාදී ඇති දඬුවමේ ස්වභාවය අනුව ඉහත සඳහන් උසස්වීමේ දිනය 2023.01.02ට පසුව යෙදෙන දිනයක් විය හැකිය.

උදාහරණ :-

- වැටුප් වර්ධක තුනකට වැඩි වැටුප් වර්ධක ප්‍රමාණයක් විලම්භනය කර විනය දඬුවමක් පනවා ඇති අවස්ථාවකදී, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යපටිපාටික රීති 186 (ii) අනුව වැටුප් වර්ධක විලම්භනය කරනු ලබන කාලසීමාව සතුටුදායක සේවා කාලයට ගණනය නොකල යුතු බැවින් නිලධාරියාගේ සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේදී වසර තුනකට වැඩි කාල සීමාවක් බැහැර කල යුතු වීම
- යම් නිශ්චිත කාලයක් දක්වා උසස්වීම් විලම්භනය කිරීමට විනය දඬුවමක් පනවා ඇති අවස්ථාවකදී, එම විනය දඬුවම අවසන් වන දිනය දක්වා උසස්වීම් ලබා දීමට නොහැකි වීම.

2. උදාහරණ 02

අනුමත බඳවා ගැනීමේ පටිපාටිය හෝ සේවා ව්‍යවස්ථාවේ හෝ සඳහන් විධිවිධාන අනුව නිර්බාධක ක්‍රමය යටතේ වසර 10ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසු ඉහළ ශ්‍රේණියට උසස්වීමට හැකි අවස්ථාවකදී, දෙවන උපලේඛනය අනුව විනයානුකූල දඬුවමක් ලැබූ නිලධාරියකුගේ ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස්වීමේ දිනයන් උසස්වීමට අදාළ අනෙකුත් සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇත්නම් වරද සිදු කරනු ලැබූ දිනය අනුව පහත සඳහන් පරිදි වේ.

| | | | |
|---|---|---|---|
| පත්වීම් දිනය | 2010.01.02 | 2010.01.02 | 2010.01.02 |
| වරද සිදු කල දිනය | 2014.05.20 | 2017.05.20 | 2019.05.20 |
| වසර 10ක සක්‍රීය සේවා කාලය සම්පූර්ණ කරනු ලබන දිනය | 2020.01.02 | 2020.01.02 | 2020.01.02 |
| වසර 10ක සතුටුදායක සේවා කාලය සම්පූර්ණ කරනු ලබන දිනය (කාර්යපටිපාටික රීති 186 (ii) අනුව වසර එකක කාල සීමාවක් සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේදී බැහැර කිරීම අනුව) | 2021.01.02 | 2021.01.02 | 2021.01.02 |
| රා.සේ.කො. චක්‍රලේඛ අංක 01/2020 සඳහන් විධිවිධාන අනුව උසස්වීමට සුදුසුකම සම්පූර්ණ කරනු ලබන දිනය (අනෙකුත් සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇත්නම්) | **2021.01.02** | **2021.01.02** | **2021.01.02** |

3. උදාහරණ 03

අනුමත බඳවා ගැනීමේ පටිපාටිය හෝ සේවා ව්‍යවස්ථාවේ හෝ සඳහන් විධිවිධාන අනුව නිර්බාධක ක්‍රමය යටතේ වසර 10ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසු ඉහළ ශ්‍රේණියට උසස්වීමට හැකි අවස්ථාවකදී, ලඝු විනය ක්‍රියාපටිපාටිය යටතේ විනයානුකූල දඬුවමක් ලැබූ නිලධාරියකුගේ ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස්වීමේ දිනයන් උසස්වීමට අදාළ අනෙකුත් සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇත්නම් වරද සිදු කරනු ලැබූ දිනය අනුව පහත සඳහන් පරිදි වේ.

| | | | |
|---|---|---|---|
| පත්වීම් දිනය | 2010.01.02 | 2010.01.02 | 2010.01.02 |
| වරද සිදු කල දිනය | 2014.05.20 | 2017.05.20 | 2019.05.20 |
| වසර 10ක සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කරනු ලබන දිනය | 2020.01.02 | 2020.01.02 | 2020.01.02 |
| වසර 10ක සතුටුදායක සේවා කාලය සම්පූර්ණ කරනු ලබන දිනය (කාර්යපටිපාටික රීති 186 (ii) අනුව වසරක කාල සීමාවක් සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේදී බැහැර කිරීම අනුව) | 2021.01.02 | 2021.01.02 | 2021.01.02 |
| රා.සේ.කො. චක්‍රලේඛ අංක 01/2020 සඳහන් විධිවිධාන අනුව උසස්වීමට සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන දිනය (අනෙකුත් සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇත්නම්) | **2021.01.02** | **2021.01.02** | **2021.01.02** |

4. උදාහරණ 04

අනුමත බඳවා ගැනීමේ පටිපාටිය හෝ සේවා ව්‍යවස්ථාවේ හෝ සඳහන් විධිවිධාන අනුව නිර්බාධක ක්‍රමය යටතේ වසර 10ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසු ඉහළ ශ්‍රේණියට උසස්වීමට හැකි අවස්ථාවකදී, විනයානුකූල නොවන හේතුවක් මත වැටුප් වර්ධක විලම්භනය කර ඇති නිලධාරියකුගේ ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස්වීමේ දිනයන් උසස්වීමට අදාළ අනෙකුත් සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇත්නම් පහත සඳහන් පරිදි වේ.

උදා : - කාර්යක්ෂමතා කඩඉම නියමිත දිනට සම්පූර්ණ නොකිරීම හේතුවෙන් නිලධාරියකුගේ වැටුප් වර්ධක විලම්භනය කර ඇති අවස්ථාවකදී

| | | | |
|---|---|---|---|
| පත්වීම් දිනය | 2010.01.02 | 2010.01.02 | 2010.01.02 |
| වැටුප් වර්ධක විලම්භනය කර ඇති කාල සීමාව | 2013.01.02 සිට 2014.01.01 දක්වා | 2016.07.02 සිට 2017.07.01 දක්වා | 2019.07.02 සිට 2020.07.01 දක්වා |
| වැටුප් වර්ධක විලම්භනයවී ඇති සේවා කාලය | වසර 01 | වසර 01 | වසර 01 |
| වසර 10ක සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කරනු ලබන දිනය | 2020.01.02 | 2020.01.02 | 2020.01.02 |
| වසර 10ක සතුටුදායක සේවා කාලය සම්පූර්ණ කරනු ලබන දිනය (කාර්යපටිපාටික රීති 186 (ii) අනුව වැටුප් වර්ධක විලම්භනය කර ඇති කාල සීමාවක් සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේදී බැහැර කිරීම අනුව) | 2021.01.02 | 2021.01.02 | 2021.01.02 |
| රා.සේ.කො. චක්‍රලේඛ අංක 01/2020 සඳහන් විධිවිධාන අනුව උසස්වීමට සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන දිනය (අනෙකුත් සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇත්නම්) | **2021.01.02** | **2021.01.02** | **2021.01.0 2** |

5. උදාහරණ 05

විනයානුකූල දඬුවමක් ලබා ඇති නිලධාරියකු, අනුමත බඳවා ගැනීමේ පටිපාටිය හෝ සේවා ව්‍යවස්ථාවේ හෝ සඳහන් විධිවිධාන අනුව සීමිත හෝ කුසලතා ධාරාව යටතේ බඳවා ගැනීමක් හෝ පුරප්පාඩු සංඛ්‍යාව අනුව ඉහළ ශ්‍රේණියකට උසස් කිරීමක් සඳහා හෝ සුදුසුකම් ලබනු දිනය පහත සඳහන් පරිදි වේ.

| | | | |
|---|---|---|---|
| වරද සිදු කල දිනය | 2019.05.20 | 2019.05.20 | 2019.05.20 |
| වරදේ ස්වභාවය අනුව විනයානුකූල දඬුවම ලබා දී ඇති ආකාරය | පළමු උපලේඛනය යටතේ | දෙවන උපලේඛනය යටතේ | ලඝු විනය ක්‍රියාපටිපාටිය අනුව |
| රා.සේ.කො. චක්‍රලේඛ අංක 01/2020 සඳහන් විධිවිධාන අනුව උසස්වීම හෝ බඳවා ගැනීම හෝ සඳහා සුදුසුකම සම්පූර්ණ කරනු ලබන දිනය (අනෙකුත් සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇත්නම්) | **2024.05.20** | **2021.05.20** | **2020.05.20** |
| ඒ අනුව උසස්වීමක් හෝ බඳවා ගැනීමක් හෝ සඳහා සලකා නොබලනු ලබන කාල සීමාව | **2019.05.20** සිට **2024.05.20** දක්වා | **2019.05.20** සිට **2021.05.20** දක්වා | **2019.05.20** සිට **2020.05.20** දක්වා |

6. උදාහරණ 06

සුදුසකම් පරික්ෂාකිරීමේ දිනට පසු එහෙත් උසස්වීම ක්‍රියාත්මක වන දිනට පෙර සිදුකල වරදක් සම්බන්ධයෙන් විනයානුකූල දඬුවමක් ලබා ඇති නිලධාරියකු / චෝදනා පත්‍රයක් ලබා දී ඇති නිලධාරියකු, අනුමත බඳවා ගැනීමේ පටිපාටිය හෝ සේවා ව්‍යවස්ථාවේ හෝ සඳහන් විධිවිධාන අනුව සීමිත හෝ කුසලතා ධාරාව යටතේ බඳවා ගැනීමක් හෝ පුරප්පාඩු සංඛ්‍යාව අනුව ඉහළ ශ්‍රේණියකට උසස් කිරීමක් සිදු කිරීමේදී කටයුතු කල යුතු ආකාරය පහත සඳහන් පරිදි වේ.

| | | | |
|---|---|---|---|
| වරද සිදු කල දිනය | 2020.05.20 | 2020.05.20 | 2020.05.20 |
| වරදේ ස්වභාවය අනුව චොදනා පත්‍රය ලබා දී ඇති ආකාරය | පළමු උපලේඛනය යටතේ | දෙවන උපලේඛනය යටතේ | ලඝු විනය ක්‍රියාපටිපාටිය අනුව |
| සුදුසුකම් පරික්ෂා කරනු ලබන දිනය | 2020.01.01 | 2020.01.01 | 2020.01.01 |
| බඳවා ගැනීම හෝ උසස්වීම ක්‍රියාත්මක වන දිනය | 2020.08.15 | 2020.08.15 | 2020.08.15 |
| රා.සේ.කො. චක්‍රලේඛ අංක 01/2020 සඳහන් විධිවිධාන අනුව උසස්වීම හෝ බඳවා ගැනීම හෝ සම්බන්ධයෙන් කටයුතු කල යුතු ආකාරය | **විනය පරික්ෂණය සම්බන්ධයෙන් අවසන් තීරණයක් ලබා දෙනතුරු උසස්වීම හෝ පත්වීම ලබා දීම තාවකාලිකව අත්හිටවිය යුතුය** | | |
| විනය පරික්ෂණය අවසානයේ විනයානුකූල දඬුවමක් ලබා දී ඇත්නම් | **උසස්වීම හෝ බඳවා ගැනීම හෝ සඳහා සුදුසුකම් ලබනු නොලැබේ.** | | |

7. උදාහරණ 07

රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 ක්‍රියාත්මක වන 2020 ජනවාරි 01 දිනට පෙර පූර්වාසන්න වසර පහ (05)ක සතුටුදායක සේවා කාලය සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවය හැර ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස්වීමට අදාළ අනෙකුත් සියලුම සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන්ගේ නිර්බාධක ශ්‍රේණි උසස්වීම් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් පසු 2020.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ලබාදීමට පත්වීම් බලධරයා විසින් කටයුතු කල යුතුය.

ඒ අනුව අනුමත බඳවා ගැනීමේ පටිපාටිය හෝ සේවා ව්‍යවස්ථාවේ හෝ සඳහන් විධිවිධාන අනුව නිර්බාධක ක්‍රමය යටතේ වසර 10ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසු ඉහළ ශ්‍රේණියට උසස්වීමට හැකි අවස්ථාවකදී, නිලධාරියකුගේ ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස්වීමේ දිනයන් උසස්වීමට අදාළ අනෙකුත් සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇත්නම් වරද සිදු කරනු ලැබූ දිනය අනුව පහත සඳහන් පරිදි වේ.

| | | | |
|---|---|---|---|
| පත්වීම් දිනය | 2006.01.01 | 2006.01.01 | 2006.01.01 |
| වරද සිදු කල දිනය | 2015.05.20 | 2015.05.20 | 2015.05.20 |
| වරදේ ස්වභාවය අනුව චෝදනා පත්‍රය ලබා දී ඇති ආකාරය | පළමු උපලේඛනය යටතේ | දෙවන උපලේඛනය යටතේ | ලඝු විනය ක්‍රියාපටිපාටිය අනුව |
| වසර 10ක සක්‍රීය සේවා කාලය සම්පූර්ණ කරනු ලබන දිනය | 2016.01.01 | 2016.01.01 | 2016.01.01 |
| වසර 10ක සතුටුදායක සේවා කාලය සම්පූර්ණ කරනු ලබන දිනය (කාර්යපටිපාටික රීති 186 (ii) අනුව සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේදී අදාළ සේවා කාලයන් බැහැර කිරීම අනුව) | 2019.01.01 ***** | 2017.01.01 | 2017.01.01 |
| රා.සේ.කො. චක්‍රලේඛ අංක 01/2020 සඳහන් විධිවිධාන අනුව උසස්වීමට සුදුසුකම සම්පූර්ණ කරනු ලබන දිනය (අනෙකුත් සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇත්නම්) | **2020.01.01** | **2020.01.01** | **2020.01.01** |

***** වැටුප් වර්ධක 03කට අඩු වැටුප් වර්ධක ප්‍රමාණයක් විලම්භනය කර ඇති අවස්ථාවක් සඳහා පමණි. ලබාදී ඇති දඬුවමේ ස්වභාවය අනුව උදාහරණ 01 සටහන යටතේ ඇති පරිදි උසස්වීම සඳහා සුදුසුකම් ලබන දිනය වෙනස් විය හැකිය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එම්. ඒ. බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව